# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2386/27 – 2024 මැයි මස 31 වැනි සිකුරාදා – 2024.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2019/222.

**කාර්මික ආරාවුල් පනත – 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.11.29 දිනැති හා අංක 2360/50 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ* ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2022.11.22 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අඟුළුගහ, අඹකොටුව, හවුපේ වෙලගොඩවත්ත හි පදිංචි කේ.ජී.ජී.යූ.කුමාර මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, කෝවිල් වීදිය, අංක 09 හි පිහිටි ඉන්ෆොමැක්ස් කොන්ක්‍රීට් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 80/2023 හා 2024.03.15 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 041995 – 18 (2024/05)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

යොමු අංකය : A/80/2023.
: IR/COM/02/2019/222.

*පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම*

කේ.ඒ.ඒ.යූ. කුමාර මහතා,
නීතිඥ හසංක රාජරත්න මහතා,

කේ.ඒ.ඒ.යූ.කුමාර මහතා,
හවුපේ වෙලගොඩවත්ත,
අඹකොටුව,
අගුළුගහ.

*පළමු පාර්ශ්වය*

*දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටීම*

*ඒ. එච්. එම්. ආර්. ඩී. අබේකෝන් මහතා,*
නීතිඥ ලක්සිරි හේවගේ මහතා,
නීතිඥ නවෝද්‍යා පොල්ගම්පොල මහත්මිය,

ඉන්ෆෝමැක්ස් කොන්ක්‍රීටින් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 09,
කෝවිල් වීදිය,
කොළඹ 10.

*දෙවන පාර්ශ්වය*

ප්‍රදානය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදයේ වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) (වන කාර්මික ආරාවුල් පනතේ) 4(1) වගන්තියෙන් ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව 2023.11.22 හා අංක IR/COM 02/2019/222 ලිපියෙන් ඒ.බී. හේරත් වන මා බේරුම්කරු වශයෙන් පත්කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට තුඩුදුන් කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව පහත සඳහන් දෙපාර්ශ්වය අතර, උද්ගතවී ඇති කාර්මික ආරාවුලයි.

මෙම ආරාවුලට හේතු වී ඇති කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් නීතිඥ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා විසින් නිකුත් කරන ලද ඔහුගේ අංක IR/COM/02/2019/222 හා 2023.11.07 දින ලිපිය අනුව "ඉන්ෆොමැක්ස් කොන්ක්‍රීටින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවක කේ. ඒ. ඒ. යූ. කුමාර මහතාට ඉදිරිපත් කළ චෝදනා හා ලබා දී ඇති දඬුවම් මගින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේ ද යන්නත් එසේ සිදු වී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**බේරුම්කරණය විභාගයේ පසුබිම හා එය පැවැත්වූ ආකාරය**

මෙම කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු වශයෙන් බුද්ධික ප්‍රභාත් කරුණාතිලක මහතා පත්ව සිටි අතර එම මහතා මෙම බේරුම්කරණයෙන් ඉල්ලා අස් වී ඇති බව A/34/2022 ගොනුවෙන් පැහැදිලි වේ. එම බේරුම්කරණය යටතේ පළමු හා දෙවන පාර්ශ්ව වල පළමු ප්‍රකාශයන් ලබා දී ඇති අතර අදාළ කාර්මික ආරාවුල පිළිබඳව 2022.09.12 සිට 2023.09.22 දක්වා නඩු වාර 08 කදී විභාග යන් පවත්වා ඇත. මේ අනුව මෙම බේරුම්කරණය අවුරුදු දෙකකට ආසන්න කාලයක් මේ වන විටත් පවත්වාගෙන ගොස් ඇත.

එබැවින් මෙම බේරුම්කරණය දෙපාර්ශ්වයේම එකඟතාවයෙන් එතෙක් ඉදිරිපත් කරන ලද සාක්ෂි හා ලිඛිත ලිපි ලේඛන ආදියද සැලකිල්ලට ගනිමින් එතැන් සිට ඉදිරියට පවත්වා ගෙන යාමට මම තීරණය කළෙමි. (පිටු අංක 016)

මෙම බේරුම්කරණය දීර්ඝ කාලයක් පවත්වාගෙන යමින් තවදුරටත් පවත්වාගෙන යාමට දෙවන පාර්ශ්වය උනන්දු වූ බව සඳහන් කරමි.

මෙම බේරුම්කරණය සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය විසින් සියුම් නිති තර්ක හා ඇතැම් ලේඛන ඔප්පු කිරීමේ බාරයට යටත් කිරීමේ අවස්ථා මෙන්ම මෙම පැමිණිල්ල ප්‍රතික්ෂේප කරන ලෙසටත්, මෙය ඇසීමේ බලයක් කාර්මික අධිකරණයට නොමැති බවටත් දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද නිතී තර්ක හා ලිඛිත ඉල්ලීම් හා උත්සාහයන් ද අවසාන ලිඛිත දේශන වලදී ඇතැම් ලේඛන හා නඩු තීන්දු පිළිගන්නා ලෙසද කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප කරමින් ද පවත්වාගෙන ගිය බේරුම්කරණයක් බව සඳහන් කරමි. මෙම බේරුම්කරණය කළට වේලාවට අවසන් කිරීමේ අවශ්‍යතාවයන් රටේ වත්මන් ආර්ථික අර්බුදයත් සැලකිල්ලට ගනිමින් මා හට ලබා දෙන ලෙස ලිඛිත උපදෙස් පරිදි ඒ පිළිබඳව දෙපාර්ශ්වය දැනුවත් කර ඊට අවශ්‍ය සහයෝගය ලබා දීමට කටයුතු කරන ලෙසට ඉල්ලා සිටින ලදි.

මෙම බේරුම්කරණ සඳහා පළමු පාර්ශ්වය විසින් x1 සිට x7 (iv) දක්වා ලකුණු කරන ලද ඇමුණුම්ද සාක්ෂි සටහන් හා දෙවන පාර්ශ්වය විසින් මෙම බේරුම්කරණය සඳහා ඉදිරිපත් කරන ලද පළමු හා අවසාන ලිඛිත දේශන මගින්ද විභාග අවස්ථාවන්හීදී ද කරුණු ඉදිරිපත් කර ඇත.

නඩු අංක A/34/2022 හා A/80/2023 යටතේ නඩු විභාග පැවැත්වූ දිනයන්

| | |
|---|---|
| 2022.09.12 | 2024.01.11 |
| 2022.11.08 | 2024.01.26 |
| 2023.01.20 | 2024.02.13 |
| 2023.03.30 | 2024.02.20 (ලිඛිත දේශන) |
| 2023.04.25 | |
| 2023.06.09 | |
| 2023.09.01 | |
| 2023.09.22 | |
| 2023.12.19 | |
| 2023.12.21 | |

මෙම නඩුවේ ඉල්ලුම්කරු වන කළංසූරිය ආරච්චිගේ අනුර උදිත කුමාර මහතා 2005 මැයි මාසයේ ඉන්ෆෝමැක්ස් කොන්ක්‍රීට්(ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ කම්කරුවකු වශයෙන් සේවයට බැඳී ඇති අතර 2007.03.25 වන දින ලිපියෙන් ඔහු එම සමාගම විසින් 2007.03.26 වන දින සිට කම්කරුවකු ලෙස සේවය ස්ථිර කර පත්වීම් ලිපියක් ලබා දී ඇත. (x1 ලිපිය) (පිටු අංකය 041)

මෙම සමාගම විසින් 2009.03.17 වන දින ඉල්ලුම්කරු වෙත ලිපියක් යවමින් ආයතනයට අයත් LD - 3016 දරන ට්‍රක් රථයේ සේවයේ යෙදෙමින් සිටියදී අයුතු ලෙස ඉන්ධන ඉවත් කිරීමේ සිද්ධියක් මත සේවය අත්හිටවූ බව ප්‍රධාන විධායක නිලධාරී විසින් දැනුම් දී ඇත.

මෙම සිද්ධියට අදාළව ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 26798 දරන නඩුව හබරාදූව පොලිස් ස්ථානය මඟින් පවරා තිබූ අතර අදාළ නඩුවෙන් දෙවැනි විත්තිකරු වූ ඉල්ලුම්කරු 2015.10.19 වන දින නිදොස් කොට නිදහස් කර ඇත.(x3 ලිපිය) (පිටු අංකය 045) ඒ අනුව ඉල්ලුම්කරු 2016.01.11 දාතමින් නඩු තීන්දුව සමග ලිපියක් මගින් තමාට සාධාරණයක් ඉෂ්ට කරන ලෙසට ඉල්ලීමක් දෙවන පාර්ශ්වය වෙත කර ඇත.(x4 ලිපිය පිටුව 053)

එහෙත් එම ලිපිය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු දෙවන පාර්ශ්වය විසින් සිදු නොකළ නිසා ඉල්ලුම්කරු පසුව මේ සම්බන්ධව ගාල්ල සහකාර කම්කරු කොමසාරිස් වෙත පැමිණිලි කිරීමෙන් පසු (පිටු අංක 032 - Y 1 ලිපිය) දෙවන පාර්ශ්වය විසින් විනය පරීක්ෂණයකට කැඳවා විනය පරීක්ෂණයක් පැවැත්වූ බවත් එහි තීරණය තමා වෙත මේ දන්වා නොමැති බවයි. (පිටු අංක 054- x5 ලිපිය)

දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කළ දිවුරුම් ප්‍රකාශයේ 07 පරිදි පවත්වාගෙන යනු ලැබූ විනය පරීක්ෂණය අවසන් කිරීමක් සිදු කර නොමැති බව පිළිගෙන ඇත. (පිටු අංක 029)

**නිගමන හා නිර්දේශයන්**

2022.09.09 දාතමින් මේ ආරාවුල පිළිබඳව දෙවන පාර්ශ්වය විසින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කරමින් එහි 1 III යටතේ සඳහන් කර ඇත්තේ "එනම් ඉල්ලුම්කරු සිය පැමිණිල්ල ඉදිරිපත් කරන අවස්ථාව වන විට වග උත්තරකාර සමාගම ඉල්ලුම්කරුගේ සේවය අවසන් කර වසර 7ක කාලයක් ඉක්මවා ගොස් ඇති බවයි" එහෙත් එසේ සේවය අවසන් කළ බව දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරු වෙත දැනුම් දී නොමැති බව තහවුරු විය. (පිටු අංක 12A) ගොනුව A/34/2022 තවද එම ලිපියෙන් IV පරිදි "තාක්ෂණික කාරණා මත ඉහත කී නඩුවෙන් ඉල්ලුම්කරු නිදහස් වී ඇති නමුත් සොරකම් කිරීමේ චෝදනාවට ලක් ව ඇති ඉල්ලුම්කරු කෙසේ වෙතත් නැවත සේවයට බඳවා ගැනීමේ හැකියාවක් නොමැති බවත් " සඳහන් කර ඇත.

මේ අනුව දෙවන පාර්ශ්වයේ අවසාන ලිඛිත දේශනයෙන් 10 පරිදි (පිටු අංක 065) ඒ අනුව ඉල්ලුම්කරු වෙත චෝදනා ඉදිරිපත් කිරීමක් සිදුවී නොමැති අතර එකී චෝදනා මත පදනම් ව ඉල්ලුම්කරුට දඬුවම් ලබාදීමත් සිදු වී නොමැති බව සඳහන් කර ඇත. සේවය අත්හිටුවීමට අදාළ ලිපිය (A/34/2022) (පිටු අංක 23) අනුව ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 26798ට අදාළ චෝදනාම ඉල්ලුම්කරුගේ සේවය අත්හිටුවීමටත් චෝදනා නැගීමටත් උපයෝගී කරගෙන තිබෙන බව නිගමනය කරමි. මේ අනුව දෙවන පාර්ශ්වය විසින් චෝදනා නොනැගීම හා දඬුවම් නොකිරීම යන මතය මා විසින් ප්‍රතික්ෂේප කළ බව සඳහන් කරමි.

එය එම ලිපියේ VII (පිටු අංකය 063) අනුව ඉල්ලුම්කරුට දඬුවම් ලබාදීමත් හෝ සිදු වී නොමැත යන්න ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ එනම් 2005.03.17 සිට මේ දක්වා කිසිදු වැටුපක් නොගෙවා විනය පරීක්ෂණයක් නොපවත්වා දිගටම සේවය අත්හිටුවා තිබීම දඬුවමක් ලෙස සැලකීමට සිදු වේ.

ඒ අනුව ඉල්ලුම්කරුට දෙවන පාර්ශ්වය විසින් ලබාදුන් පත්වීමේ කොන්දේසි (x1 ලිපිය) (පිටුව 18) 04 හා 05 කොන්දේසි දෙවන පාර්ශ්වය විසින් කඩ කර ඇති බව නිරීක්ෂණය වේ. එමෙන් ම පත්වීම් ලිපියේ 13 වන කොන්දේසිය අනුව "වෙනත් ස්ථානයක මොනයම් ආකාරයෙන් හෝ සේවයේ යෙදීම සපුරා තහනම් කර ඇත." (පිටු අංක 20 x 1 ) මේ අනුව දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුට වෙනත් සේවාවක නිරත වීමද අහිමි කර ඇත.

ඒ නිසාම ආර්ථික වශයෙන් ඉල්ලුම්කරු අපහසුතාවයට පත් වූ බවට අවසාන ලිඛිත දේශනයේ කරන සඳහන් කිරීම සත්‍ය බැව් පෙනී යයි. 2024.02.20 අවසාන ලිඛිත දේශනයේ පිටු අංක 039 හි 21 ඡේදයේ ඒ බව සඳහන් කර ඇත.

තවද 2022.09.09 (පිටු අංක 12) දාතමින් ගාල්ල සහකාර කම්කරු කොමසාරිස් වෙත යොමු කළ ලිපියෙන් දෙවන පාර්ශ්වය එම ලිපියේ 1III යටතේ "එනම් ඉල්ලුම්කරු සිය පැමිණිල්ල ඉදිරිපත් කරන අවස්ථාව වන විට වගඋත්තරකාර සමාගම ඉල්ලුම්කරුගේ සේවය අවසන් කර වසර 07 ක කාලයක් ඉක්මවා ගොස් ඇත." යනුවෙන් කර ඇති ප්‍රකාශය තහවුරු කිරීමට අවශ්‍ය ලියකියවිලි හෝ සාක්ෂි මෙම නඩුව විභාග වන අවස්ථාවේ අධිකරණයට ඉදිරිපත් කිරීමට දෙවන පාර්ශ්වය අපොහොසත් වී ඇත.

එම ලිපියේ 2 II යටතේ සිය රථයේ ඩීසල් සොරකම් කිරීම මත හබරාදූව පොලිස් ස්ථානාධිපතිවරයා විසින් නඩු අංක 26798 යටතේ නඩු පවරා ඇත යනුවෙන් ඉල්ලුම්කරුට විරුද්ධව චෝදනා නඟා ඇත.

තවද එම ලිපියේ IV (පිටු අංක 12) යටතේ තාක්ෂණික කාරණා මත ඉල්ලුම්කරු නිදහස් වී ඇති නමුත් සොරකම් කිරීමේ චෝදනාවට ලක්වී ඇති ඉල්ලුම්කරු කෙසේ වෙතත් නැවත සේවයට බඳවා ගැනීමේ හැකියාවක් නොමැති බවට චෝදනා නඟමින් ඉල්ලුම්කරු ඒ වන විටත් දඬුවම් කර ඇති බව පෙනී යයි. (x 5) ලිපිය අනුව පෙනී යන්නේ 2016.10.17 පෙ.ව 11.30 විනය පරීක්ෂණයක් පැවැත්වෙන බවට ඉල්ලුම්කරුට යැවූ ලිපියයි. දෙවන පාර්ශ්වයේ චෝදනා නොනැගුවේ නම් විනය පරීක්ෂණයක් සඳහා ඉල්ලුම්කරුව කැඳවීම් කරන්නේ ඇයිද යන්නයි. ඉහත සමස්ථ කරුණු අනුව දෙවන පාර්ශ්වය සිය අවසාන ලිඛිත දේශනයේ සඳහන් කළ කරුණු පිළිගැනීමට අපහසු බවට මම තීරණය කරමි.

ඉල්ලුම්කරුගේ රැකියාවට අදාළ 2009 වර්ෂයේ මූලික වැටුප රු.7550.00 ලෙසටත් 2022 වර්ෂය වන විට එය මූලික වැටුප රු. 22000.00 පමණ වන බවත් ඔහු 2021.10.31 දරන (පිටු අංකය 16) සිය දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇත.

මේ අනුව ඉල්ලුම්කරු වන කේ.ඒ.ඒ.යු. කුමාර නැමති අයගේ සේවය දෙවන පාර්ශ්වය විසින් 2009.03.17 ලිපිය මගින් වැටුප් රහිත ව අත්හිටුවීමත් අදාළ අධිකරණ නියෝගයෙන් දෙවන වගඋත්තරකරු වූ ඉල්ලුම්කරු නිදොස් කොට නිදහස් කිරීමෙන් පසු නැවත සේවයේ හිඟ වැටුප් සහිතව පිහිටු වීමට ඉල්ලුම්කරු ඉල්ලීමක් සිදු කළත් එය මේ දක්වා ඉටු කර නොමැති අතර ඒ වැරදි තීරණයක් බවත් එමගින් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදු වී ඇති බවටත් මා නිගමනය කරමි.

ඒ අනුව පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට දෙවන පාර්ශ්වය නියෝග කරමි. මෙම ප්‍රදානය ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* පළවී දින 14 කින්

I 2009.03.17 වන දින සිට ඉල්ලුම්කරු හිඟ වැටුප් සහිතව නැවත සේවයේ පිහිටු වීම හා ඒ බව ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දීම.

II 2009.03.17 ලිපියෙන් දෙවන පාර්ශ්වය සඳහන් කළ විනය පරීක්ෂණයක් පිළිබඳ තීරණය මේ දක්වා ඉල්ලුම්කරුට දැනුම් දී නොමැති නිසා අදාළ විනය පරීක්ෂණය මසක් තුළ පවත්වා අවසන් කර එම තීරණය ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දීම

III 2009.03.17 සිට මොහු සේවයේ පිහිටුවන බව දැනුම් දෙන ලිපියේ දිනය දක්වා වන කාල සීමාවට ඉල්ලුම්කරුට හිඟ වැටුප් ලබාදීම හා හිඟ වැටුප් වර්ධක ලබා දීම හා පත්වීම් ලිපියේ කොන්දේසි ප්‍රකාරව සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට අදාළ සියලුම හිඟ මුදල් ගණනය කර ඉල්ලුම්කරුගේ වැටුපෙන් අඩුකර යැවීමට දෙවන පාර්ශ්වය කටයුතු කළ යුතු බවට නියෝග කරමි.

**ප්‍රදානය**

ඉහතින් සඳහන් කළ ආකාරයට මෙම නියෝගය ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* පළ වීමෙන් දින 14 පසු දෙවන පාර්ශ්වය වන ඉන්ෆෝමැක්ස් කොන්ක්‍රීට් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය එම නියෝග අනුව ක්‍රියා කළ යුතු අතර එසේ කටයුතු කළ බවට අදාළ ලිපිවල පිටපත් හා ආවරණ ලිපියක් මගින් මසක් ඇතුළත ගාල්ල දිස්ත්‍රික් කම්කරු කර්යාලය වෙත දැනුම් දිය යුතු බවට නියම කරමි. තවද ඉල්ලුම්කරුට හිමි සේවක අර්ථසාධක හා සේවා භාරකාර අරමුදල් හා අනෙකුත් දීමනා සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් වෙත ඉල්ලුම් කිරීමට මෙම ප්‍රදානය බාධාවක් නොවන බවද සඳහන් කරමි.

මෙම තීරණය කාර්මික නිතීය ඉහළින්ම පිළිගැනෙන යුක්ති සහගත තීරණයක් බව ද සඳහන් කරමි.

2024 මාර්තු මස 15 වැනි දින
බේරුම්කරණය හා කාර්මික අධිකරණයේ දීය.

**ඒ.බී හේරත්,**
බේරුම්කරු.

EOG 05 - 0195

---

මගේ අංකය: IR/COM/05/J/2014/35.

**කාර්මික ආරාවුල් පනත – 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.08.26 දිනැති හා අංක 2138/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2019.08.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1.කෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුර, මාදිවෙල, මණ්ඩල පෙදෙස, අංක 27 හි පදිංචි ඩී.ඩී.මාලිනි සිරිවර්ධන මිය 2. නුගේගොඩ, ගංගොඩවිල, පරණ කැස්බෑව පාර, 2 වන පටුමඟ, අංක 124/3 හි පදිංචි දීපානි ලිවේරා මිය 3. මත්තේගොඩ, අරලිය උයන, අංක 63 හි පදිංචි මරීනා ගුණවර්ධන මිය සහ කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 215 හි පිහිටි ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 89/2019 හා 2024.04.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 අප්‍රේල් මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේදී

බේරුම්කරු නීතිඥ ඕබඩගේ ලීලාරත්න මැතිතුමා ඉදිරිපිටදීය.

1. ඩී.ඩී.මාලනී සිරිවර්ධන මිය,
නො.27,
මණ්ඩල පෙදෙස, මාදිවෙල,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

නඩු අංකය- A/89/2019
IR/COM/05/J/2014/35

2. දීපානී ලිවේරා මිය,
නො. 124/3, 2 වන පටුමග,
පරණ කැස්බෑව පාර,
ගංගොඩවිල, නුගේගොඩ.

3. මරීනා ගුණවර්ධන මිය,
නො. 63, අරලිය උයන,
මත්තේගොඩ.

*පළමුවන පාර්ශ්වය*

එදිරිව.

ශ්‍රී ලංකා හස්තකර්මාන්ත මණ්ඩලය,
නො. 215, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07

*දෙවැනි පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංකන 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"ඩී.ඩී.මාලනී සිරිවර්ධන, දීපානි ලිවේරා සහ මරීනා ගුණවර්ධන යන අයට වැටුප් සංශෝධනයන් සිදු කිරීමේදී හා වැටුප් පියවරයන්හි පිහිටුවීමේදී අසාධාරණයක් සිදුව තිබේද? අසාධාරණයක් සිදු වී තිබේ. නම් තැබිය යුතු වැටුප් පියවර හා හිමිවිය යුතු සහන කවරේද? යන්න පිළිබඳ වේ.

**පෙනී සිටීම.**

පළමු පාර්ශ්වය වෙනුවෙන් - නීතිඥ පුබුදු ද සිල්වා මහතා.
දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් - නීතිඥ ඩී.අයි.ආර්.රණවක මහතා

**ආරාවුලට හේතුපාදක වූ පසුබිම.**

මෙම ඉල්ලුම්කාරියන් තිදෙනා සිය සේවායෝජකයා වන ශ්‍රී ලංකා හස්තකර්මාන්ත මණ්ඩලයේ සේවය කරමින් සිටියදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 327 වැටුප් සංශෝධනයේදී මෙම ඉල්ලුම්කාරියන් නිසි ලෙස වැටුප් තලයෙහි පිහිටුවා නොමැති බව පවසා ආයතනයේ විධායක අධ්‍යක්ෂ (පාලන) විසින් විධායක අධ්‍යක්ෂිකා (මුදල්) වෙත යොමුකර ඇති වැටුප් නිවැරදි කිරීමේ ලිපියට අනුව ඉහතකී තිදෙනාට හිඟ මුදල් ගෙවීමට ඇති බැවින් එම මුදල්වලින් කොටසක් මෙම තිදෙනා වෙත ගෙවා ඇති අතර, එහි හිඟ මුදල නොගෙවීම පිළිබඳව හටගත් ආරාවුල නිරවුල් කිරීම සඳහා බේරුම්කරණය වෙත යොමුකොට ඇත. මෙම ආරාවුලට හේතුපාදක වී ඇත්තේ ඉහත කරුණු වේ.

**ප්‍රදානය ලබාදීමට හේතුපාදක වූ කරුණු**

දෙපාර්ශ්වය විසින්ම ඉදිරිපත් කරන ලද පළමු හා දෙවැනි ප්‍රකාශ මෙන්ම දෙපාර්ශ්වයම විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි මෙන්ම සලකුණු කරන ලද ලේඛන සම්බන්ධයෙන් හා දෙපාර්ශ්වයේම අවසාන ලිඛිත සැලකිරීම් සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී. පළමු පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කාරියන් තිදෙනා සාක්ෂි ලබාදුන් අතර, ඊට අමතරව සුරේකා සංජීවනී කන්නන්ගර,චන්දන නන්දකුමාර දහනායක (අධ්‍යක්ෂ මානව සම්පත් හා පාලන), කාර්මික සබඳතා අංශයේ කම්කරු නිලධාරී එම්.බී. මහගොඩ මහත්මිය, සාක්ෂි ලබා දෙන ලදී. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් නදීකා යාමිනී ගුණරත්න (සහකාර කළමණාකරු පාලන), හබරගමු රාලලාගේ රජිත ගුණතිලක (සහකාර ආයතන අධ්‍යක්ෂ), යන අය සාක්ෂි ලබාදෙන ලදී. ඉන් අනතුරුව දෙපාර්ශ්වයම තම ලිඛිත දේශණ ගොනුකරන ලදී.

මෙහිදී විශේෂයෙන්ම සඳහන් කළ යුතු කරුණක් වනුයේ මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාරියන් තිදෙනා අතරින් තුන්වන ඉල්ලුම්කාරිය වන මරීනා ගුණවර්ධන මහත්මිය මෙම බේරුම්කරණ නඩුවෙන් ඉවත්වන බවට වාචිකව හා ලිඛිතව ප්‍රකාශ කිරීම හේතුකොටගෙන ඇය මෙම බේරුම්කරණයෙන් ඉවත්වූවා සේ සලකා කටයුතු කරන බවද, ඇය සම්බන්ධයෙන් කිසිදු ප්‍රදානයක් සිදු නොකරන බවද, සාක්ෂි සලකා බැලීම සිදුකරනුයේ අනිකුත් ඉල්ලුම්කාරියන් දෙදෙනා සම්බන්ධයෙන් වන බවද, විශේෂයෙන්ම සටහන් කරමි. ඒ අනුව පළමුවන සහ දෙවන ඉල්ලුම්කාරියන් සම්බන්ධයෙන් පමණක් මෙතැන් සිට සාක්ෂි සලකා බැලීම සිදු කරමි.

මෙම බේරුම්කරණ නඩුවේ දී ඉදිරිපත් වූ ලේඛන අතුරින් ඉතාමත් වැදගත් හා මෙම ආරාවුල පුරාවටම සාකච්ඡාවට බඳුන් වූ A 21 සහ A 42 ලේඛන කෙරෙහි විශේෂ අවධානය යොමු කලෙමි.

මෙම ලේඛන දෙකම මෙම බේරුම්කරණයේ දෙවැනි පාර්ශ්වයේ අදාළ බලයලත් නිලධාරියා වන විධායක අධ්‍යක්ෂ (පාලන) විසින් නිකුත්කරන ලද ලේඛනයක් වන අතර, එම ලේඛනය දෙවැනි පාර්ශ්වය විසින් කිසිදු අවස්ථාවක අභියෝගයට ලක් නොකරන ලදී. ඒ සම්බන්ධයෙන් දෙවැනි පාර්ශ්වයේ ස්ථාවරය වූයේ මෙම ලේඛන එවකට විධායක අධ්‍යක්ෂක විසින් දෝෂ සහගත ලෙසට නිකුත්කර ඇති ලේඛනයක් යන්න පමණි. අනික් අතට මෙම ලේඛන දෙක මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කාරියන් දෙදෙනාගේ පුද්ගලික ලිපිගොනුවල ද ඇතුලත්ව තිබීම ඉතා වැදගත් කරුණකි. මෙම ලේඛන මගින් මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාරියන් දෙදෙනාට හිඟ වැටුප් හිමිවන බවට සේවායෝජක පාර්ශ්වයේ නිසි බලධරයකු විසින් නිකුත්කර ඇති ලේඛනයක් වන අතර හිඟ වැටුප් ගෙවීමට ඇති බව හෙළි වේ. එම ලේඛන ආයතනය විසින් නිකුත්කර ඇති බවට දෙවැනි පාර්ශ්වය වන සේවායෝජක විසින් පිළිගෙන ඇත. මෙම ලේඛන දෙකට අනුව මෙම වැටුප් නිවැරදි කිරීම සිදුකර ඇත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 327 ට අනුව බව එම ලේඛන වල ඉතා පැහැදිලි ලෙස සටහන්කර ඇත. එම නිවැරදි කිරීමට අදාළ මුදල සම්බන්ධයෙන් ඉන් කොටස් කිහිපයක් මෙම පලමු පාර්ශ්වයේ ඉල්ලුම්කාරියන් වෙත ආයතනය විසින් ගෙවීම් කර ඇත. එනම් එක් අයකුට රුපියල් පනස් දහස (රු.50,000/-) බැගින් අවස්ථා දෙකකදී ගෙවා ඇත. එනම් එක් අයකුට රුපියල් එක් ලක්ෂයක (රු.100,000/-) ක මුදලක් බැගින් ගෙවා ඇත. මේ සම්බන්ධයෙන් දෙවැනි පාර්ශ්වය විසින් මීට අමතරවත් මුදල් ගෙවූ බවට ලේඛන ඉදිරිපත් කළද එම ලේඛන විධිමත් ලේඛන නොවන අතර, පළමු පාර්ශ්වය විසින් ඒවා ප්‍රතික්ෂේප කරන ලද අතර, අතිරේක මුදල් ගෙවූ බව සනාථ කිරීමට දෙවැනි පාර්ශ්වය අපොහොසත්වී ඇත.

මෙම බේරුම්කරණයේ පළමු පාර්ශ්වයේ පළමු ඉල්ලුම්කාරිය වන ඩී.ඩී.මාලනී සිරිවර්ධන මහත්මිය විසින් මෙම හිඟ වැටුප් සම්බන්ධයෙන් 2014.02.20 දින පැමිණිල්ලක් (A 29) කම්කරු කොමසාරිස්වරයා වෙත ඉදිරිපත්කර ඇති අතර, ඉන් අනතුරුව නැවතත් A 30 ලේඛනයට අනුව ද කම්කරු කොමසාරිස්වරයාට මේ සම්බන්ධයෙන් පැමිණිලිකර ඇත. එම පැමිණිල්ල සම්බන්ධයෙන් දිගු කළක් තිස්සේ කම්කරු දෙපාර්තමේන්තුවේදී පරීක්ෂණ සිදුකර ඇත. එම පරීක්ෂණය සම්බන්ධයෙන් කම්කරු නිලධාරිනී, එම්. බී. මහගොඩ සාක්ෂි ලබා දී ඇත. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් කාර්මික සම්බන්ධතා අංශයෙන් ප්‍රථමයෙන්ම පරීක්ෂණයක් සඳහා දෙපාර්ශ්වය කැඳවා ඇත්තේ 2014-04-30 දින (A 31) දින වේ. මේ සම්බන්ධයෙන් කාර්මික සම්බන්ධතා අංශයේ සහකාර කොමසාරිස් පවිත්‍රා වරකාගොඩ මහත්මිය විසින් සේවායෝජක වෙත යවන ලද A 33 දරන ලිපියෙහි A 33 a කොටසට අනුව අදාළ ඉල්ලුම්කාරිය වෙත මුදල් ගෙවීමට ආයතනය විසින් හිඟ ගණනය කරමින් සිටින බව සහ A 33 c ඡේදයට අනුව එම මුදල් ගෙවා කම්කරු කොමසාරිස් වෙත දැනුම්දෙන ලෙස ද දක්වා ඇත. තවද, A 35 දරන 2018-04-24 දිනැති ලිපිය මගින් මෙම බේරුම්කරණයේ පළමු ඉල්ලුම්කාරියට අමතරව දෙවැනි සහ තුන්වැනි ඉල්ලුම්කාරියන් ද ඇතුළත්කර ගන්නා බව දන්වා ඇත. (A 35 b). A 37 දරන 2019-02-25 දරන ලේඛනය මගින් මෙම ඉල්ලුම්කාරියන් තිදෙනා විසින් නැවතත් කම්කරු කොමසාරිස් (කාර්මික සබඳතා) වෙත ලිපියක් යොමු කරමින් අවුරුදු 05 කට අධික කාලයක් මෙම ආරාවුල් බේරුම් කිරීමට අපොහොසත් වීම පිළිබඳ තම අප්‍රසාදය පළ කර ඇත. ඒ අනුව මෙම ආරාවුල් බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා යොමු කර ඇති බව ද නිරීක්ෂණය වේ.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජෙනරාල්වරයා නියෝජනය කරමින් එහි සහකාර ආයතන අධ්‍යක්ෂවරයෙක් සාක්ෂි ලබාදී ඇත. එම සාක්ෂියට අනුව දෙවැනි පාර්ශ්වය විසින් රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජෙනරාල්වරයා වෙත ඉදිරිපත් කරා යයි කියනු ලබන මෙම ඉල්ලුම්කාරියන් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් කරන ලදැයි කියන ලේඛන කිසිවක් සාක්ෂියේදී ඉදිරිපත් වී නැත. ඉදිරිපත් වී ඇත්තේ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 327 සම්බන්ධයෙන් පමණි. තවද, මෙම සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් පවසා ඇත්තේ මෙම ඉල්ලුම්කාරියන් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි නම් පමණක් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 327 අනුව වැටුපෙහි නිවැරදිව පිහිටුවා තිබෙන බවයි.

එසේ මෙම ඉල්ලුම්කාරියන් සම්බන්ධයෙන් ඉදිරිපත්කර ඇති තොරතුරු මොනවාද යන්න කිසිදු අවස්ථාවක දෙවැනි පාර්ශ්වය විසින් මෙම බේරුම්කරණය වෙත යොමු නොකරන ලදී. තවද, තම සාක්ෂිකරුවකු වන ආයතන අධ්‍යක්ෂ ජෙනරාල් වෙනුවෙන් සාක්ෂි ලබාදුන් සහකාර ආයතන අධ්‍යක්ෂ ගෙන් හෝ එම සාක්ෂි ලබාගැනීමට දෙවැනි පාර්ශ්වය කිසිදු උත්සාහයක් නොගත් බව ද නිරීක්ෂණය කරමි. එසේ මෙම ඉල්ලුම්කාරියන්ට ගෙවන ලද වැටුප් ගෙවීම සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීමට නම් අනිවාර්යයෙන්ම එම ඉල්ලුම්කාරියන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් කරුණු ආයතන අධ්‍යක්ෂ ජෙනරාල්වරයා වෙත යොමුකර තිබිය යුතුවේ. එහෙත් කිසිදු අවස්ථාවක එසේ ඉදිරිපත්කරන ලද තොරතුරු දෙවැනි පාර්ශ්වය විසින් හෙළිදරව් නොකිරීම සැකයට භාජනය වන කරුණක් බව ද නිරීක්ෂණය විය.

මෙහිදී තවත් විශේෂ කරුණක් සම්බන්ධයෙන් සටහන් කිරීම ඉතා වැදගත් වේ. මෙම ආරාවුලට පාදක වී ඇති A 21 සහ A 42 ලේඛන නිකුත්කර ඇත්තේ 2009 සහ 2008 වර්ෂ වලදී වේ. මෙම සේවකයින් විශ්‍රාම ගොස් සිටි අවධියේද මෙම හිඟ මුදලින් කොටසක් ගෙවා ඇති බව නිරීක්ෂණය වේ. ඉන් අනතුරුව ඉතිරි මුදල නොගෙවීම හේතුකොටගෙන මේ සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් වරයා වෙත පැමිණිලි කර ඇත්තේ 2014 දී බව ද නිරීක්ෂණය කළෙමි. මෙම බේරුම්කාර නඩුවේ දෙවැනි පාර්ශ්වය පවසන්නේ මෙම මුදල නොගෙවා සිටියේ එය වැරදි බව නිරීක්ෂණය වූ නිසා බවයි. එසේ නම් අවම වශයෙන් මේ පිළිබඳ අවධානය යොමුව ඇත්තේ 2011 වර්ෂයේදී වත් විය යුතුය. එවන් පසුබිමක දෙවැනි පාර්ශ්වය වන සේවායෝජක විසින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් මේ පිළිබඳව විමසීමට 2018 වර්ෂය වනතෙක් බලා සිටීම ද ගැටළු සහගත තත්ත්වයක් වන අතර, අවම වශයෙන් 2018 දී හෝ මෙම ඉල්ලුම්කාරියන් සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවන ලද ලේඛනවල පිටපතක් හෝ ඉදිරිපත් කිරීමට දෙවැනි පාර්ශ්වය අපොහොසත්වී ඇති අතර, එසේ අදාළ ලේඛන ඉදිරිපත් නොකිරීම ද සැකයට තුඩු දෙන කරුණක් බව ද නිරීක්ෂණය කළෙමි.

මෙම බේරුම්කරණයේ පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාරියන් දෙදෙනාම තමන් වෙත ආයතනය මගින් විධිමත්ව නිකුත්කර ඇති A 21 සහ A 42 ලේඛන පදනම් කරගනිමින් තමන්ගේ සම්පූර්ණ සාක්ෂියම ඉදිරිපත් කර ඇති අතර, එම ලේඛන පදනම් කරගනිමින් හිඟ මුදල් ගණනය කර ඉදිරිපත් කර ඇති බවද නිරීක්ෂණය කළෙමි. මෙම ආරාවුලේ ප්‍රධානතම සාක්ෂියක් වී ඇති මෙම ලේඛන දෙක කිසිදු අවස්ථාවක ආයතනය විසින් අභියෝගයට ලක්කොට නොමැති අතර, දෙවැනි පාර්ශ්වය විසින් ඔප්පු කිරීමට උත්සාහ කරන ලද්දේ එවකට සේවය කරන ලද විධායක අධ්‍යක්ෂ (පාලන) සමග මෙම ඉල්ලුම්කාරියන් එකතුව මෙම ලිපිය තමන් වෙත නිකුත් කරවා ගත් බවටයි. එහෙත් එම කරුණ ඔප්පු කිරීමට අවශ්‍ය කිසිදු සාක්ෂියක් දෙවැනි පාර්ශ්වය විසින් ඉදිරිපත් නොකරන ලද බව ද අවධානයට යොමු කළෙමි.

මෙම බේරුම්කරණ නඩුවේ දෙවැනි පාර්ශ්වය දිගින් දිගට උත්සාහ කර ඇත්තේ මෙම පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද A 21 සහ A 42 ලේඛන මත හිඟ මුදල් ගණනය කර ඇති ආකාරය වැරදි සහගත බව පමණි. එහෙත් දෙවැනි පාර්ශ්වය විසින් ඔප්පු කළ යුතුව තිබුනේ මෙම ලේඛන දෙක අසත්‍ය ලේඛන බව විනා එම ලේඛන නිකුත්කර ඇති පුද්ගලයන් විවේචනය කිරීම නොවන බව අවධාරණය කරමි. දෙවැනි පාර්ශ්වය විසින් තමන් විසින්ම නිකුත් කර ඇති ලේඛන දෝෂ සහගත බව දැක්වීමට උත්සාහ කළද එය නිසි පරිදි ඔප්පු කර ගැනීමට ඔවුනට හැකියාව ලැබී නැත. මන්ද යත් මේ පිළිබඳව දෙවැනි පාර්ශ්වය විසින් කැඳවා තිබූ ආයතන අධ්‍යක්ෂ ජෙනරාල් වරයා වෙනුවෙන් සාක්ෂි ලබා දුන් සහකාර ආයතන අධ්‍යක්ෂ වරයා විසින් දිගින් දිගටම තම සාක්ෂියේදී දක්වා සිටියේ ආයතනය විසින් මෙම ඉල්ලුම්කාරියන් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි නම් පමණක් තමන් විසින් ලබාදී ඇති තීරණය නිවැරදි බවයි.

එහෙත් දෙවැනි පාර්ශ්වය වන ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය කිසිදු අවස්ථාවක එසේ ඉදිරිපත්කර ඇති තොරතුරු මොනවාද යන්න හෙළි කිරීම හිතා මතාම මගහැර ඇති පසුබිමක ඒ පිළිබඳ ප්‍රබල සැකයක් ජනිත වීම නොවැළැක්විය හැකි බව ද අවධාරණය කරමි.

මෙම බේරුම්කරණ ගොනුව සම්බන්ධයෙන් වූ පරීක්ෂණය දිගුකළක් පවත්වාගෙන යාමට සිදු වූ කරුණු අතර, එවකට රටේ පැවති කොරෝනා වසංගතය ප්‍රධාන හේතුවක් වූ අතර, මෙහි දෙවැනි ඉල්ලුම්කාරිය හදවත් සැත්කමකට භාජනය වීමෙන් හා රෝගී තත්ත්වය හේතුවෙන් විදේශගත වීම යන හේතු කාරණා වසර 1 ½ කට පමණ කාලයකට මෙම පරීක්ෂණය නිසි පරිදි පවත්වා ගෙන යාමට නොහැකි වීමට බලපෑ බව ද විශේෂයෙන් සඳහන් කරමි.

ඉහත සියළුම කාරණා සලකා බැලීමේදී පැමිණිල්ලේ ප්‍රධාන ලේඛන වූ A 21 සහ A 42 යන ලේඛන අභියෝගයට ලක්කිරීමට දෙවැනි පාර්ශ්වය අසමත්වී ඇති අතර, ඉදිරිපත් කර ඇති කිසිදු සාක්ෂියක් මගින් එම ලේඛන අභියෝගයට ලක්කිරීමට කිසිසේත්ම හැකිවී නොමැති බව ද නිරීක්ෂණය කළෙමි. ඒ අනුව මාගේ ප්‍රදානය පහත පරිදි සටහන් කරමි.

1. මෙම බේරුම්කරණයේ පළමු පාර්ශ්වයේ පළමු ඉල්ලුම්කාරිය වන ඩී. ඩී. මාලනී සිරිවර්ධන මහත්මියට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 327 අනුව වැටුප් සකස්කිරීමේදී නිසි පරිදි වැටුප් සකස් නොකිරීම මත (ආයතනය විසින්ම සකස්කරන ලද ලේඛනයක් (A 21) අනුව) ගෙවිය යුතු හිඟ වැටුප වන රුපියල් පන්ලක්ෂ හැට එක් දහස් තිස් එක (රු. 561,031/-) ක මුදලින් (x 1ලේඛනය) මේ වන විට ගෙවා ඇති රුපියල් එක් ලක්ෂය (රු.100,000/-) ක මුදල අඩුකළ පසු ඉතිරි රුපියල් හාරලක්ෂ හැට එක් දහස් තිස් එක (රු. 461,031/-) ක මුදලක් මෙම ප්‍රදානය රජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද දිනයේ සිට දින තිහ (30)ක් ඇතුළත එම ඉල්ලුම්කාරියට ලබාගත හැකිවන සේ සහකාර කම්කරු කොමසාරිස් (මැද කොළඹ) වෙත තැන්පත් කරන ලෙසට දෙවැනි පාර්ශ්වයවන ශ්‍රී ලංකා හස්තකර්මාන්ත මණ්ඩලයට මෙයින් නියම කරමි.

2. මෙම බේරුම්කරණයේ පළමුවැනි පාර්ශ්වයේ දෙවැනි ඉල්ලුම්කාරිය වන දීපානි ලිවේරා මහත්මියට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 327 අනුව වැටුප් සකස් කිරීමේදී නිසි පරිදි වැටුප් සකස් නොකිරීම මත (ආයතනය විසින්ම සකස් කරන ලද ලේඛනයක් (A 42) අනුව) ගෙවිය යුතු හිඟ වැටුප වන රුපියල් පන්ලක්ෂ එකොලොස් දහස් අටසිය අසූ එක (රු. 511,881/-) ක මුදලින් (A 49 ලේඛනය අනුව) මේ වන විට ගෙවා ඇති රුපියල් එක් ලක්ෂය (රු. 100,000/-) ක මුදල අඩු කළ පසු ඉතිරිවන මුදලවන රුපියල් හාරලක්ෂ එකොලොස් දහස් අටසිය අසූ එක (රු. 411,881/-) ක මුදලක් මෙම ප්‍රදානය රජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද දිනයේ සිට දින තිහ (30) ක් ඇතුළත එම ඉල්ලුම්කාරියට ලබාගත හැකිවන පරිදි සහකාර කම්කරු කොමසාරිස් (මැද කොළඹ) වෙත තැන්පත් කරන ලෙසට දෙවැනි පාර්ශ්වය වන ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට මෙයින් නියම කරමි.

3. මෙම බේරුම්කරණයේ පළමුවැනි පාර්ශ්වයේ තුන්වන ඉල්ලුම්කාරිය වන මරීනා ගුණවර්ධන මහත්මිය මෙම බේරුම්කරණයෙන් ඉවත් වූ බැවින් ඇය සම්බන්ධයෙන් කිසිදු ප්‍රදානයක් නොකරමි.

මෙම ප්‍රදානය යුක්ති සහගත සහ සාධාරණ තීරණයක් බවට සහතික කරමි.

**නීතිඥ ඕබඩගේ ලීලාරත්න.**
බේරුම්කරු,

2024 අප්‍රේල් මස 08 වැනි දින.

EOG 05 - 0196

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.